# වගා රෝග පිළිබඳ උපදෙස්

කිසෝගම, ගැටුලාව, ඒ. කේ. ප්‍රේමතිලක,
පට්ටියෙගෙදර, ආර්. එම්. ශාන්ත ජයරත්න,
හිලෝගම, ඩබ්ලිව්. එම්. ඇලෝසිංඤෝ
ගුන්නැපාන, ඒ. පී. නවරත්න යන මහත්වරු.

විවිධ බෝග හා වගාවන් පිළිබඳව ඔබට අවශ්‍යව ඇති තොරතුරු හා පත්‍රිකා ඔබ පළාතේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක හා කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැන ගෙන් හෝ කෙලින් ම පහත සඳහන් ලිපිනයට ලියා ලබා ගත හැකි ය.

කෘෂිකර්ම ප්‍රවෘත්ති සේවය,
තැ. පෙ. 636,
කොළඹ.

තවද, ඇතැම් වගාවන්ට වැළඳෙන රෝග පිළිබඳව අපගෙන් උපදෙස් විමසා ඇත. මෙය කෘෂිකර්ම දෙපාර්තමේන්තු ව්‍යාප්ති අංශයේ කාර්ය දමයන්ට අයත් වේ. එනිසා ඔබ වගාවන්ට රෝගයක් බෝවූ විට ඔබ පළාතේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක හෝ කෘෂිකර්ම උපදේශකට වගාව පෙන්වා උප දෙස් ලබා ගන්න. වගා රෝග පිළිබඳ උපදෙස් දීම පත්හිඳ මගින් නොකෙරෙන බව ද සලකන්න.

## සුළං මෝල්

මහනුවර, උඩුවෙල වතුයාය, ප්‍රජන්ත රත්වත්ත හා ඒ. ඒ. ඇල්බට් යන මහත්වරු.

ජුනි ගොවි ජනතාව සඟරාවේ සඳහන් සුළං මෝල් පිළිබඳව යි. බණ්ඩාරවෙළ දිස්ත්‍රික් කයේ ඇල්ලටත් හීල් ඔයටත් අතර දුම්රිය මාර්ගය අසල පිහිටි කුඩා ඉඩමකට ජලය සැපයීමට අවශ්‍යව ඇත. මෙම ඉඩම ඇත් තේ අඩි 300 ක පමණ ඉහළිනි. මෙතන ගොවිපලක් ඇරඹීමට අදහස් කළ ද, ජලය සපයා ගැනීම ප්‍රශ්නයක්ව ඇත. මෙහිලා සුළං මෝළක් හෝ වෙන ක්‍රමයකින් ජලය ලබා ගැනීමට පහසුකම් ඇත්නම් උපදෙස් දෙන්න.

අප ලිපියේ සඳහන් කළ පරිදි ග්‍රාමීය පෙදෙස්වලට සුදුසු සුළං මෝල් වර්ග දෙකක් ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර් ධන මධ්‍යස්ථානය විසින් නිර්මානය කර තිබේ. කරුණාකර එම ආයතනයට මේ පිළි බඳව ලියා විමසන්න.

ලිපිනය: අධ්‍යක්ෂ, ජාතික ඉංජිනේරු පර් යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථා නය, 285, ගාළු පාර, කොළඹ 3.

## අතුරු බෝග

අලව්ව, ආර්. ඒ. විජයරත්න රාජපක්ෂ මහතා

මෙම ප්‍රදේශයේ වී ගොවිතැනට වඩා දියුණු කළ හැක්කේ අතුරු බෝග වගාවයි. මේ අනුව ගම්මිරිස්, කරාබු, කෝපි, කහ, ඉඟුරු වැනි බෝග මෙහි වගා කරනු ලැබේ.

මෙම බෝග සඳහා වගා පිළිවෙත් සහ සුදුසු රසායනික පෝර වර්ග ගැනත් සරල විස්තරයක් කරන්න.

මේ පිළිබඳව තොරතුරු හා උපදෙස් මෙම ලිපිනයට ලියා විමසන්න.

අධ්‍යක්ෂ,
සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව,
159, ධර්මපාල මාවත,
කොළඹ 7.

## $p^H$ අගය

මහගම, සුනිල් ජයතිලක මහතා

පසක $p^H$ අගය යනු කුමක්ද?

ඔබ ප්‍රශ්නයට පිළිතුරු 1976 ජුලි ගොවි ජනතාවේ කෘෂිකාර්මික ප්‍රශ්න / පිළිතුරු යටතේ පළවී ඇත.